ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

# පුවත්පත් නිවේදනය

## ඉහළ නංවන ලද ඉන්දිය මූල්‍යාධාර වැඩසටහන යටතේ යාපනය විශ්ව විද්‍යාලයේ විද්‍යාර්ථීන්ට ශිෂ්‍යත්ව බෙදා දේ

2026 ජුනි 02 වන දින ඉන්දිය මහ කොමසාරිස් සන්තෝෂ් ජා මැතිතුමා විසින් ඉන්දිය ප්‍රදාන යටතේ යාපනය විශ්ව විද්‍යාලයේ අඩු ආදයම්ලාභී පවුල්වල දක්ෂ සිසු සිසුවියන් වෙත ඉහළ නංවන ලද මූල්‍යාධාර පිරිනමන ලදී. මෙම මූල්‍යාධාර වැඩසටහන 2025-26 අධ්‍යයන වර්ෂයේදී ආරම්භ විය.

2. පෙරදී, එනම් අධ්‍යයන වර්ෂ 2023-24 දී යාපනය විශ්ව විද්‍යාලය සඳහා ඉන්දිය ප්‍රදාන යටතේ මූල්‍යාධාර වැඩසටහනක් ක්‍රියාත්මක කෙරුණු අතර ඒ යටතේ ආර්ථික පසුබිම සහ අධ්‍යයන කාර්යසාධනය මත පදනම්ව තෝරාගත් සිසුන් 100 දෙනෙකු සඳහා මසකට ශ්‍රී ලංකා රුපියල් 5000ක මුදලක් ලබා දෙන ලදී.

3. මෙම මූල්‍යාධාර වැඩසටහන සම්බන්ධයෙන් ලද ධනාත්මක ප්‍රතිචාර මෙන්ම විද්ස්වවිද්‍යාල බලධාරින්ගෙන් සහ සිසු සිසුවියන්ගෙන් ලද ඉල්ලීම් සැලකිල්ලට ගනිමින්, අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා ශ්‍රී ලංකා ජනාධිපති අතිගරු අනුර කුමාර දිසානායක මැතිතුමාගේ 2024 දෙසැම්බර් ශ්‍රී ලංකා සංචාරය අතරතුරදී, ඉන්දියාව විසින් නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සහ යාපනය විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථීන් සඳහා වැඩි දියුණු කළ මූල්‍යාධාර වැඩසටහනක් ක්‍රියාත්මක කරන බව නිවේදනය කළේය.

4. මෙම වැඩිදියුණු කළ යෝජනා ක්‍රමය යටතේ 2025-26 අධ්‍යයන වර්ෂයේ සිට සෑම වසරකම පළමු වසරේ ඉගෙනුම ලබන සිසු සිසුවියන් 100 දෙනෙකුට මසකට ශ්‍රී ලංකා රුපියල් 7500ක මූල්‍යාධාරයක් අධ්‍යයන පාඨමාලාව අවසන් වන තෙක්ම පිරිනැමේ. ඒ අනුව, මෙම වැඩසටහන ක්‍රියාත්මක කර සිව් වන වසරේදී, විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථීන් 400 දෙනෙකුට මූල්‍යාධාර හිමි වනු ඇත.

5. මෙම අවස්ථාවේ අදහස් දක්වමින්, මහ කොමසාරිස් සන්තෝෂ් ජා මැතිතුමා අවධාරණය කළේ මූල්‍ය සහයෝගය සිසුන්ගේ අධ්‍යාපන කටයුතුවලට මහත් ශක්තියක් වන බවයි. එබැවින්, වඩා වැදගත් වන අධ්‍යාපනය, වර්ධනය සහ අනාගතය වෙත අවධානය යොමු කිරීමට සිසුන්ට හැකි වන බව එතුමා සඳහන් කළේය.

6. ඉන්දියාව විසින් ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ සංවර්ධන හවුල්කාරිත්ව ව්‍යාපෘතීන් රැසක් ක්‍රියාත්මක කර තිබෙන අතර තවත් ව්‍යාපෘතීන් රැසක් ක්‍රියාත්මක වෙමින් පවතී. මෙය ද එවන් එක් ව්‍යාපෘතියකි. රුහුණු විශ්වවිද්‍යාලයේ ඉදිකළ රබින්ද්‍රනාත් තාගෝර් අනුස්මරණ ශ්‍රවණාගාරය; උතුරු පළාතේ පාසල් 79කට අධික සංඛ්‍යාවක් නවීකරණය කිරීම; දිවයින පුරා අධ්‍යාපන ආයතන සඳහා බස් 110ක් සැපයීම; දකුණු පළාතේ පාසල් 200ක සුහුරු පන්ති කාමර සහ පරිගණක විද්‍යාගාර ස්ථාපනය කිරීම සහ උතුරු මැද පළාතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ බහු වාර්ගික ත්‍රෛභාෂා පාසලක් ඉදිකිරීම තවත් එවැනි ව්‍යාපෘතීන් කිහිපයකි. වතුකරයේ පාසල් 9ක් වැඩි දියුණු කිරීම සහ වතුකරයේ තෝරා ගන්නා ලද පාසල් සඳහා සුහුරු පන්ති කාමර 60ක් ස්ථාපනය කිරීම යන ව්‍යාපෘතීන් දැනට ක්‍රියාත්මක වෙමින් පවතී.

****

**කොළඹ**
***2026* ජූනි *02***